Department of Education Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : පෙරදිග සංගීතය

සතිය : සිව්වන සතිය

ශ්‍රේණිය : 06

සකස් කිරීම : W.S.D. ලසන්ත ප්‍රනාන්දු මයා
කෑ/මාව/දැලිවල ම.වි -මාවනැල්ල

# හඬ නිපදවිය හැකි මෙවලම් සෑදීම

## ඇතිල්ලීමෙන්, පෙළීමෙන්, පිඹීමෙන් හඬ නිපදවිය හැකි සංගීත මෙවලම් සකසමු

විවිධ සංගීත භාණ්ඩවල හඬ ආසන්න වශයෙන් පරිසරයෙන් සපයා ගත හැකි විවිධ ද්‍රව්‍ය උපයෝගී කරගෙන සාදාගත හැකි මෙවලම් ආදේශක භාණ්ඩ යනුවෙන් හැඳින්විය හැකිය. අප අවට පරිසරයේ ඇති ප්‍රයෝජනයට ගෙන ඉවත දමන බොහෝ දෑ තුළින් විවිධ වූ ආදේශක භාණ්ඩ සකසා ගත හැකිය. තත්, සුෂිර, ඝන, අවනද්ධ යන සිව් වැදෑරුම් භාණ්ඩවලට ආදේශක සෑදිය හැකිය.

ප්ලාස්ටික් බෝතල්, එක්රේකාඩ්, එස්ලෝන් බට, රිපිෆෝම්, ලෑලි, හිස් පෑන්, ඉරටු, යකඩ පට්ටම්, යකඩ ඇණ, කම්බි, තහඩු කැබලි ආදී විවිධ දෑ තුළින් මෙම කාර්ය ඉටුකර ගත හැකිය. ආදේශක භාණ්ඩ ලෙස ග්ලොකන්ස්පිල්. බටනලා, එක්රේ ඩ්‍රම්සට්, ජලතරංග, පන්තේරුව, මරකාස් ආදී භාණ්ඩ සාදා ගත හැකිය.

**ක්‍රියාකාරකම** — ආදේශක මරකාසයක් සෑදීම

අවශ්‍ය අමුද්‍රව්‍ය

- ඉවත දමන ලද ප්ලාස්ටික් බෝතල් කිහිපයක්
- මුං ඇට, සහල් ඇට හා කඩල ඇට ප්‍රමාණාත්මකව

- ❖ බෝතල්වලට එක් එක් වර්ගයේ ඇට පුරවා නිකුත්වන හඬෙන් මිහිරි හඬ සොයන්න
- ❖ ඇට වර්ග මිශ්‍ර කර රුචිකත්වය අනුව මරකාසයක් සාදාගන්න

**පැවරුම්**

01- ආදේශක සංගීත භාණ්ඩ යනු කුමක්දැයි හඳුන්වන්න

02- සාදාගත හැකි ආදේශක භාණ්ඩ කිහිපයක් නම්කරන්න

03- ආදේශක සංගීත භාණ්ඩ සෑදීමට අවශ්‍යවන අමුද්‍රව්‍ය 05 ලියන්න

04- ඉහත දක්වා ඇති (ක්‍රියාකාරකම) ආදේශක සංගීත භාණ්ඩය සාදන්න

05- ඔබ දන්නා වෙනත් ආදේශක සංගීත භාණ්ඩ 02 සාදා එය සාදන ආකාරය පියවරෙන් පියවරට ලියන්න